# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2024 ඔක්තෝබර් / නොවැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

## සාහිත්‍ය විචාරය (නව නිර්දේශය)

ග්‍රීක රෝම යුගයන්හි සාහිත්‍ය නිර්මාණ හා සෞන්දර්ය සංකල්ප අධ්‍යයනය

**LTCR 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. "ග්‍රීසියෙහි භූගෝලීය හා සමාජ දේශපාලන පසුබිම, අනන්‍ය හා ස්වායත්ත ලක්ෂණවලින් හෙබියා වූ ශිෂ්ටාචාරයක් ප්‍රභවය වීම කෙරෙහි නිශ්චිතව ම බලපෑවේ ය." තත් ප්‍රකාශයෙහි නිරවද්‍යතාව සනිදර්ශන ව පරීක්ෂා කරන්න.

02. "ග්‍රීක පෞර රාජ්‍ය අතර ස්ථාපිත ව පැවතියේ සපුරා සමාන දේශපාලන යන්ත්‍රණයක් හෝ සංස්කෘතික සම්ප්‍රදායක් නොවේ." ඇතැන්සය සහ ස්පාටාව කෙරෙහි විශේෂාවධානයෙන් යථෝක්ත මතය විභාග කරන්න.

03. හිහියස්තු (Hephaistos) අඛිල (Achilles) වෙනුවෙන් නිර්මිත පලිහ වෙතින් මූර්තිමත් ග්‍රීක සංස්කෘතිය ඉලියඩ් **(Iliad)** වීර කාව්‍යයෙහි තන්හි තන්හි ගැබ්ව ඇති ආකාරය සනිදර්ශන ව විමසන්න.

04. "ග්‍රීක දේව ගණයා තම බලයෙන් ප්‍රමෝද වී මිනිසුන් පෙළන ආකාරය ඉලියඩ් වීරකාව්‍යයෙහි පිළිබිඹු වේ." මෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

05. "හෝමර් විසින් රචිත ඔඩිසි වීරකාව්‍යය සමකාලීන ග්‍රීක ප්‍රභූ ප්‍රජාවගේ සමාජ සංස්කෘතික ජීවිතය අධ්‍යයනයෙහි ලා අනුපූරක මූලාශ්‍රයක් වශයෙන් වැදගති." පරීක්ෂා කරන්න.

06. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයෙහි ලා පැනෙන කාව්‍යමය සත්‍යය හා ඓතිහාසික සත්‍යය සංකල්ප පිළිබඳ ව තුලනාත්මක ව විග්‍රහ කරන්න.

07. ෆිලොක්ටීටීස් නාට්‍යයේ චරිත හා සිදුවීම් ගැන විවරණයක් කරන්න.

08. ප්ලෝටස්ගේ කඹය නාට්‍යයෙහි නිරූපිත මානව පුරුෂාර්ථ පිළිබඳ සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

09. හොරස් විසින් රචිත කාව්‍යකරණ කලාව (Ars Poetica), සෞන්දර්ය රසඥතාව විහීන ව පැවති යුගයක අවරසිකයන්ට කළ ආමන්ත්‍රණයකැයි කීමේ යුක්තියුක්තතාව විභාග කරන්න.

10. ලොංජයිනස් විසින් නිර්දේශිත උත්කෘෂ්ටත්වය (sublimity) කරා නැංවුණු කාව්‍යයක විද්‍යමාන ලක්ෂණ කවරේදැයි සනිදර්ශන ව විමර්ශනය කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

***********************************